# 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, උතුරු මැද පළාත.

## වැය ශීර්ෂ අංකය - 620

## අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. ආයතනය පිළිබඳ හැඳින්වීම

පළාත් කෘෂිකර්ම ,කෘෂි නිෂ්පාදන අලෙවි ,සත්ත්ව නිෂ්පාදන සහ සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්තිවලට අනුකුල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් උතුර මැද පළාතේ කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු යන අංශයන්ගෙන් පළාත සංවර්ධනය කිරීම සඳහා බලධාරීත්වය දරණ රාජ්‍ය ආයතනය වේ. මෙම කර්තවයන් සාර්ථකව ක්‍රියාත්මක කිරිම සදහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක කටයුතු කරනු ලබයි.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීම සඳහා විශාල කාර්ය භාර්යක් ඉටු කරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් කෘෂිකර්මික නිෂ්පාදන හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම , අලෙවිය හා තාක්ෂණික සංවර්ධනය, කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීම, කෘෂිකර්මය ආශ්‍රිත ආයතන වල කටයුතු ශක්තිමත් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි. නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය, මහ ඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 5 ක් හා කෘෂිකර්ම උපදේශන කාර්යාල 37 ක් ඔස්සේ කෘෂිකාර්මික ජනතාව වෙනුවෙන් සේවා සැපයීම් සිදු කරනු ලබයි.

එමෙන්ම, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සම්බන්ධ සංවර්ධන කටයුතු සිදු කරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුල පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන හා ඵලදායිතාව මෙන්ම සත්ත්ව සෞඛ්‍ය සංවර්ධනය, ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම යන සංරචක ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් අධ්‍යක්ෂක කාර්යාලය, දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය අනුරාධපුර, දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය පොලොන්නරුව, තිරප්පනේ සත්ව ගොවිපළ හා පශු වෛද්‍ය කාර්යාල 29 ක් ඔස්සේ ජනතාව වෙනුවෙන් සේවා සැපයීම් සිදු කරනු ලැබේ.

එමෙන්ම, මිරිදිය ධීවර විෂයට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය ද මෙම අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන අතර, විශේෂයෙන්ම ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වත්මන් ආර්ථික හා සමාජයීය අර්බුදකාරී වාතාවරණය තුළ පළාතේ ජනතාවගේ ආහාර හා පෝෂණ අවශ්‍යතා සපුරාලීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය සතු සුවිශාල වගකීමකි. සියලු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලද සහයෝගය ලබා ගනිමින් පළාතේ කෘෂි ,සත්ව නිෂ්පාදන සහ ධිවර අංශ පුළුල්කර ප්‍රධාන වශයෙන් ස්වයංපෝෂිත ආර්ථිකයක් තුළින් පළාතේ ජන දිවිය ශක්තිමත් කිරීම අමාත්‍යාංශයේ අරමුණ වී ඇත.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම** - "ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක්."

**මෙහෙවර** - "කෘෂිකර්ම, කෘෂි හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි. සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

**අරමුණු**

දිගු කාලීන අරමුණු :-

- ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් වැඩසටහන් සැලසුම් කර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සම්ප්‍රදායන් රැකගනිමින් සහ නවීන තාක්ෂණයට අනුගත වෙමින් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පළාතේ 80 % ක් පමණ වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
- තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගත හැකි පරිදි කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- කෘෂිකර්ම, ධීවර හා සත්ව නිෂ්පාදන සියළු අංශ මගින් පළාත තුළ සංවර්ධනයක් ඇති කර ජාතික සංවර්ධනයට දායකත්වයක් ලබා දීම.
- මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් සපයන පළාත බවට පත්කිරීම.
- ධීවර කර්මාන්තයේ නියැලෙන පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම.

කෙටි කාලීන අරමුණු :-


- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුල නිම කිරීම.
- නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණය පිළිබඳ ව දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.
- වස විස නැති ආහාර පරිභෝජනයට යොමු වන පිරිස වර්ධනය කිරීම.
- සුළු පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය අනුබල සැපයීම තුලින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.
- මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම .
- මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම.
- ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.
- දේශීය මෙන්ම විදේශීය වෙළඳපළ අරමුණු කර ගනිමින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම.

## 1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

- ආයතනයේ හා දෙපාර්තමේන්තු දෙකෙහි පරිපාලන කටයුතු සිදු කිරිම.
- පිරිස් පාලන කටයුතු සිදු කිරීම.
- මූල්‍ය පාලන කටයුතු.
- කෘෂි, සත්ත්ව හා ධීවර ක්ෂේත්‍රයන්හි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
- අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය සහ කාර්යක්ෂම සේවාවක් සපයන ආයතනයක් බිහිකිරිම.
- ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය.
- කෘෂි අශ්‍රිත නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.

**1.4** සංවිධාන සටහන

<u>උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සංවිධාන සටහන</u>



## 1.5 සේවා ජාලය

1.5.1 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, දෙපාර්තමේන්තු වල ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

II. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1.5.2 දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය.
- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - 5
- කෘෂිකර්ම උපදේශන කාර්යාලය - 37 (අනුරාධපුර 32, පොළොන්නරුව 5)

II. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර.
- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව.
- සත්ත්ව ගොවිපළ, තිරප්පනේ.
- පශු වෛද්‍ය කාර්යාල - 29
- පශු වෛද්‍ය රෝහල, අනුරාධපුර.

1.5.3 ව්‍යවස්ථාපිත ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

1.5.4 පළාත් පාලන ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

**1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේනතුව/ ව්‍යවස්ථාපිත ආයතනය/ පළාත් පාලන ආයතනය සඳහා අරමුදල් ලැබෙන ප්‍රභවයන්**

| මූල්‍යකරණය | මූල්‍ය ප්‍රභවය |
|---|---|
| සාමූහික ප්‍රධාන | 22 |
| පළාත් සභා සංවර්ධන ප්‍රධාන | 23 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන | 24 |
| ලෝක බැංකු ආධාර | 33 |

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති. (තිබේ නම්)**

අ) ව්‍යාපෘතියේ නම - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)

ආ) දායක නියෝජිතායතනය - ලෝක බැංකු ආධාර හා ශ්‍රී ලංකා රජය.

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - ඇමරිකා ඩොලර් මිලියන 125.

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2019 සිට 2024 දක්වා

## 02. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්ම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ කරා ළඟාවීම උදෙසා 2022 වසර සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ප්‍රධාන වශයෙන් මිරිදිය ධීවර නිෂ්පාදිත ප්‍රවර්ධන වැඩසටහන් සහ පුහුණු හා ධාරිකා සංවර්ධන වැඩසටහන් සැලසුම් කරන ලදි.

මෙහිදි 2022 වසර සඳහා රු. මිලියන 31 ක් සඳහා පහත සඳහන් සංවර්ධන යොජනා ඉදිරිපත් කිරීම සිදු විය.

- ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් /ඇඟිල්ලන් 6,000,000 ක් මුදා හැරීම.
- සහනාධාර පදනම මත ධීවර කාර්මිකයින් 20 ක් සඳහා ධිවරයාත්‍රා ලබා දීම.
- ධීවර කර්මාන්තය සඳහා උපකරණ ලබා දීම.
- ගල්කුලම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.
- විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් සිමෙන්ති ටැංකි 30ක් සැකසීම ,විසිතුරු මත්ස්‍ය සමාජ 4ක් සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර ලබාදීම හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් යටතේ විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 300 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ධීවර කාර්මිකයින් 250 ක් සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ආයතන ධාරිතා සංවර්ධනය වෙනුවෙන් කාර්යාලීය උපකරණ 5 ක් මිල දී ගැනීම.

2022 වසර සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන සඳහා ඉහත යෝජනා ඉදිරිපත් කළ ද රටෙහි පැවති ආර්ථික අර්බුදය හමුවේ යෝජිත ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය හෝ ප්‍රතිපාදන ලැබීමක් සිදු නොවුණි .

පළාතේ ජනතාව අතර තදබල අයුරින් හටගත් ආහාර හා පෝෂණ ඌනතා තත්වයන් මත පළාතේ ධීවර අංශය වෙනුවෙන් රුපියල් මිලියන 5ක විශේෂ ප්‍රතිපාදන වෙන් වූ අතර, එම ප්‍රතිපාදන පළාතේ ධීවර නිෂ්පාදිත වර්ධනය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදිතයේ වර්ධනය වෙනුවෙන් සාර්ථක අයුරින් ආයෝජනය කිරීමේ හැකියාව ලැබුණි.

**මූල්‍ය ප්‍රගතිය.**

| විස්තරය | **ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.)** | **2022 වර්ෂයේ වියදම (රු. මි.)** | **උපයෝජනය%** |
|---|---|---|---|
| උතුරු මැද පළාතේ ජලාශ සඳහා මත්ස්‍යයින් මුදාහැරීම | 3 | 3 | 100 % |
| විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | 2 | 1.665 | 83.3 % |

**භෞතික ප්‍රගතිය.**

පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතය ඉහල නැංවීමේ අරමුණින් 2022 වසරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් 08 ක් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 354,458 ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් 09 ක් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 412,500 ක් ලෙස පළාතේ වැව් 17 ක් සඳහා ගිෆ්ට් තිලාපි සහ කොමන් කාපර් වර්ගයේ මත්ස්‍ය අගිල්ලන් 766,985 ක් මුදා හැරීම සිදු කරන ලදි.






මත්ස්‍ය ඇඟිල්ලන් මුදාහැරීම

විසිතුරු මත්ස්‍ය වගා ප්‍රවර්ධනය සඳහා විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා ප්‍රායෝගික හා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, නීරෝගී ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදනයක් උදෙසා උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානය තුළදී පළාතේ ව්‍යවසායකයන් 59ක් සඳහා මත්ස්‍ය ආහාර නිෂ්පාදන පුහුණු අවස්ථාවන් ලබා දීම සිදු කරන ලදි.

විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් සඳහා අපනයන අත්දැකීම් හුවමාරු වැඩසටහනක් ගිරිඋල්ල ලුම්බිණි ආයතනයේදී පවත්වන ලද අතර, අපනයන වෙළඳපළ මට්ටම දක්වා ගුණාත්මක හා නීරෝගී බවින් යුත් විසිතුරු මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය හා මසුන් ඇසුරුම් කිරීමේ ප්‍රමිතිය සම්බන්ධ දැනුවත් කිරීම මෙහිදී සිදු කරන ලදි. ක්ෂේත්‍ර මට්ටමින් අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව හා අපනයනකරුවන් හා ව්‍යවසායකයින් අතර සබඳතා වර්ධනයටත් මෙහිදී අවකාශ සලසා ගන්නා ලදි.






උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් පුහුණු වැඩසටහන

අපනයන අත්දැකීම් හුවමාරු වැඩසටහන

**2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්.**

- උතුරු මැද පළාතේ හඳුනාගත් ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් 5,000,000 ක් බහාලීම.
- මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 2ක් සංවර්ධනය කිරීම .
- කුඩා පරිමාණ අභිජනන මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීම .
- විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 70 ක් සඳහා ද්‍රව්‍යමය ආධාර ලබා දීම.
- ධීවර සමාජ 100 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ආයතන ධාරිතා සංවර්ධනය වෙනුවෙන් කාර්යාලීය උපකරණ 5 ක් මිල දී ගැනීම.

වර්තමාන ආර්ථික හා සමාජයීය වාතාවරණය තුළ සංවර්ධන කාර්යයන් සඳහා යම් යම් බාධාකාරී තත්ත්වයන් පැවතිය ද අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට අමාත්‍යාංශය අවශ්‍ය සියළු කාර්යයන්හි නියැලී ඇත .

ඩබ්.ජී.ඩබ්.වනසිංහ,
ලේකම්,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි,සත්ත්ව නිෂ්පාදන,
සත්ත්ව සෞඛ්‍ය හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත,

**03. පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**එන්සීපී-පීටී (එෆ්)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යංශය**

**උතුරු මැද පළාත.**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022 | | සටහන | තතය 2022 | 2021 | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1 | - | - | ආර්-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 2 | - | - | ආර්-1 |
| **-** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **-** | **-** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| 549,217,480 | භාණ්ඩාගාර අග්‍රිම | | 308,300,000 | 380,025,000 | ජී-1 |
| - | තැන්පතු | | 3,008,652 | 22,764,860 | ජී-2 |
| 1,800,000 | අත්තිකාරම් ලැබීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 3,735,614 | 2,879,885 | ජී-3 |
| - | අත්තිකාරම් ලැබීම් - අනුදත් අත්තිකාරම් | | - | - | ජී-3 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **551,017,480** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **315,044,266** | **405,669,745** | |
| **551,017,480** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **315,044,266** | **405,669,745** | |
| - | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 178,804 | 56,096,462 | |
| **551,017,480** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **314,865,462** | **349,573,283** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 36,471,280 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 3 | 30,645,677 | 27,658,362 | ඊ-3 |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ - වෙනත් දෙපා: | 3 | 255,640 | - | ඊ-3 |
| 12,800,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 4 | 7,158,750 | 5,751,990 | ඊ-3 |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා - වෙනත් දෙපාර්තමේන්තු | 4 | - | - | ඊ-3 |
| 221,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 5 | 215,479 | 192,971 | ඊ-3 |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු | 5 | 4,338 | - | ඊ-3 |
| **49,492,280** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **38,279,884** | **33,603,323** | ඊ-3 |
| | **මූලධන වියදම්** | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 6 | - | 1,225,865 | ඊ-3 |
| 54,913,386 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 7 | - | 899,770 | ඊ-3 |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් - වෙනත් දෙපාර්තමේන්තු | 7 | 2,025,995 | - | |
| 444,811,814 | ප්‍රාග්ධන මාරුකිරීම් | 8 | 271,000,000 | 294,864,231 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු | 8 | 11,665,469 | 1,591,969 | ඊ-3 |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 9 | - | - | |
| - | හැකියා වර්ධනය | 10 | - | - | |
| - | වෙනත් මූලධන වියදම් | 11 | - | - | |
| **499,725,200** | **මුළු මූලධන වියදම් (උ)** | | **284,691,464** | **298,581,835** | |
| - | තැන්පතු ගෙවීම් | | 4,587,686 | 23,852,161 | **ඡී-2** |
| 1,800,000 | අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 2,904,676 | 1,960,310 | **ඡී-3** |
| - | අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් | | - | - | **ඡී-3** |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| **1,800,000** | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **7,492,362** | **25,812,471** | |
| **551,017,480** | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **330,463,710** | **357,997,629** | |
| **-** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(15,598,248)** | **(8,424,346)** | |
| - | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ගැලපුම් ශේෂය** | | (16,671,097) | (9,497,194) | **ඡී-5** |
| - | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 1,072,848 | 1,072,848 | **ඡී-1** |
| - | | | **(15,598,248)** | **(8,424,346)** | |

**3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**එන්සීපී-පීටී (පී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යංශය, උතුරු මැද පළාත.**
**2022 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තතය<br>**2022**<br>රු. | **2021**<br>රු. |
|---|---|---|---|
| <u>**මූල්‍ය නොවන වත්කම්**</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | එන්සීපී-පීටීජී(4) | - | 121,768,221 |
| <u>**මූල්‍ය වත්කම්**</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | එන්සීපී-පීටීජී-3 | 6,972,736 | 7,803,674 |
| මුදල් හා මුදල් සමාන දෑ | එන්සීපී-පීටීජී-1 | 1,072,848 | 1,072,848 |
| **මුළු වත්කම්** | | **8,045,584** | **130,644,743** |
| <u>**ශුද්ධ වත්කම් / ස්කන්ධය**</u> | | | |
| පළාත් භාණ්ඩාගාර(යට/යෙන්) පියවියයුතු/ ලැබිය යුතු ශුද්ධ වත්කම | | 6,784,909 | 6,036,813 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | - | 121,768,221 |
| <u>**ජංගම වගකීම්**</u> | | | |
| තැන්පතු ගිණුම් | එන්සීපී-පීටීජී-2 | 187,827 | 1,766,861 |
| අග්‍රිම ශේෂය | එන්සීපී-පීටීජී-1 | 1,072,848 | 1,072,848 |
| **මුළු වගකීම්** | | **8,045,584** | **130,644,743** |

පිටු අංක..........සිට ......... දක්වා එන්සීපී-පීටීආර් (1) සිට එන්සීපී-පීටීජී (7) දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ....... සිට...... දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදු කර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| …………………… | ……………… | ………………………………….. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2023.04. | දිනය : 2023.04. | දිනය : 2023.04. |

**3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**එන්සීපී-පීටී (සී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය,උතුරු මැද පළාත.**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2022** | **2021** |
| | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් - වැන්දඹු අනත්දරු දායක | 1,237,791 | 1,202,780 |
| වෙනත් පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 5,872,308 | 5,413,196 |
| අග්‍රිම ලැබීම් | 308,300,000 | 380,025,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 2,937,629 | 2,901,986 |
| අත්තිකාරම් අයකර ගැනීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ලැබීම් | 3,008,652 | 22,764,860 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **321,356,380** | **412,307,822** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 37,804,428 | 33,410,352 |
| සහනාධාර සහ මාරුකිරීම් | 215,479 | 192,971 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද මෙහෙයුම් වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 178,804 | 56,096,462 |
| අත්තිකාරම් ගෙවීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 2,904,676 | 1,721,710 |
| අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තිකාරම් ගිණුම් | - | - |
| තැන්පතු ගෙවීම් | 4,587,686 | 23,852,161 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **45,691,073** | **115,273,656** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **275,665,307** | **297,034,166** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |

| | | |
|---|---|---|
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ආපසු ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 271,000,000 | 296,989,866 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වියදම් | 4,665,308 | 44,300 |
| වර්ෂය තුල ආයෝජනවල යෙදවුම් - මුදලින් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **275,665,308** | **297,034,166** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(275,665,308)** | **(297,034,166)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(1)** | **-** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලින් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| | | |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලට ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **(1)** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **1,072,848** | **1,072,848** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **1,072,847** | **1,072,848** |

**3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.**

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය. (අදාල නොවේ)

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසාන ඇස්තමේන්තුව | | |
| - | - | - | - | - | - |

3.6 **ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය.**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කරනු ලැබූ ප්‍රතිපාදනය වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 46,345,000 | 49,492,280 | 38,279,885 | 77.34% |
| **මූලධන** | 208,000,000 | 499,725,200 | 284,691,464 | 56.96% |
| **එකතුව** | **254,345,000** | **549,217,480** | **322,971,349** | **58.85%** |

| වැඩසටහන් නාමය * | පුනරාවර්තන | | | මූලධන | | |
|---|---|---|---|---|---|---|
| | 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම |
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | |
| පළාත් සහා පරිපාලනය | 46,345,000 | 49,492,280 | 38,279,885 | - | - | - |
| කෘෂිකර්ම සංවර්ධනය | - | - | - | 128,000,000 | 428,589,200 | 272,628,609 |
| පශු සම්පත් සංවර්ධනය | - | - | - | 80,000,000 | 71,136,000 | 12,062,855 |

*වාර්ෂික මුදල් ප්‍රකාශයේ පිටු අංක **XIV** හි වර්ගීකරණය අනුව.

3.7 **ප.මු.රී 140 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.**

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගය කර ගන්නා ලද ප්‍රතිපාදන, වෙන් කර දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | ආණ්ඩුකාරවර කාර්යාලය | මිරිදිය ධීවර හා විසිතුරු මත්සය වගාකරුවන්ට සහන සැලසීම මගින් ආර්ථිකයට දක්වන දායකත්වය ඉහල නැංවීම. | 5,000,000 | 5,000,000 | 4,665,308 | 93.30% |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.**

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා වැය විෂයට ගිණුම්ගතවූ ශේෂය | 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුලත් කල ශේෂය | 2022.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත උවද වත්කමක් ලෙස වාර්තා නොවූ ශේෂය(වත්කම් කළ.මෘදුකාංගයට ඇතුලත් නොවූ වටිනාකම) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම වත්කම් කළ. මෘදු.හරහා වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 2101 | වාහන | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | - | - | - | - |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | - | - | - | - |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | - | - | - |
| 2105 | ඉඩම් අත්පත් කර ගැනීම | - | - | - | - |
| 2106 | වෙනත් මූලධන වත්කම් | - | - | - | - |
| 2107 | යටිතල පහසුකම් වත්කම් | | - | - | |
| 2108 | කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම | - | - | - | - |
| 2109 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

- 2023.04.30 දින වන විට අවසන් විගණන වාර්තාව විගණන කාර්යාලය විසින් නිකුත් කර නොමැත.

## 04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1 | මහජන පැමිණිලි | 100% | | |
| 2 | ආයතනයේ කාර්යක්ෂමතාව | 90% | | |
| 3 | ත්‍රෛමාසික කාර්ය මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීම. | 100% | | |
| 4 | විගණන විමසුම් හා ඊට යවන පිළිතුරු. | 100% | | |
| 5 | ගිණුම් කටයුතු | 90% | | |
| 6 | යාවත්කාලීන කරන ලද හා නඩත්තු කළ ලිපිගොනු සහ ලේඛන වල මාසික ප්‍රගතිය | 100% | | |
| 7 | මිරිදිය මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය | | | |
| | පළාතේ ජලාශ 17 ක් සඳහා මත්ස්‍ය පැවටවුන් 766,958 මුදාහැර ඒ මගින් පළාතේ මත්ස්‍ය නිෂ්පාදිතයට 250 Mt එක් කිරීම හා පළාතේ පෝෂණ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම. | 100% | | |
| 8 | විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය | | | |
| | පුහුණු වැඩසටහන් 4 ක් යටතේ විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයන් 59 ක් සඳහා මත්ස්‍ය ආහාර පිළිබද අවබෝධය හා පුහුණුව ලබා දීම. | | 85% | |
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයන් 119 ක් සඳහා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන ක්ෂේත්‍රය අධ්‍යනය පහසුකම් සලසා දීම මගින් ඔවුන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම. | 100% | | |
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයන් හා අපනයනකරුවන් 400 ක සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා ව්‍යවසායකයන්ට විදේශ වෙළඳපලට පිවිසීමේ මාර්ග පිළිබඳ දැනුමක් ලබාදීම. | 100% | | |
| 9 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | | | |
| | කඩිනම් ගෙවතුවගා වැඩසටහන යටතේ පවුල් 7477 ක් සඳහා බීජ,පළතුරු පැල හා කුකුළු පැටවුන් බෙදා හැරීම මගින් ජන ජීවිතය නගා සිටුවීම. | 100% | | |
| | තෝරාගත් ගොවීන් සඳහා වතුර පොම්ප 24 ක් බෙදා හැරීම මගින් ගොවීන්ට වගාව සඳහා පහසුකම් සැලසීම. | 100% | | |
| | කෘෂි පාරවල් 10 ක් සැලසුම් කළද ඉන් 5ක වැඩ නිම කර ගොවීන්ට ප්‍රතිලාභ සැලසීම. | | | 50% |

| | | | | |
|---|---|---|---|---|
| | 2022 වර්ෂය තුළ වැව් 12 ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ගොවීන් සඳහා වාරි ජලය ප්‍රමාණවත් පරිදි ලබා දීම. (සිදු කරමින් පවතී). | | | 50% |
| | ධාන්‍ය වියලන කමත් 17 ක් ඉදිකිරීමට සැලසුම් කළද ඉන් 07ක ඉදිකිරීම් ආරම්භ කර පවත්වාගෙන යාම (සිදු කරමින් පවතී). | | | 50% |
| | කෘෂි සංවර්ධනය යටතේ බීජ වර්ග බෙදා හැරීම මගින් හෙක්ටයාර 253 ක භූමි ප්‍රමාණයක් වගා කර ඉන් මෙට්‍රික් ටොන් 374.75 නිෂ්පාදිතයක් ලබා ඇත. | | 86% | |

අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්,

**1.** තැපැල් මගින් ලැබෙන මහජන පැමිණිලි, අදහස් හා යෝජනා සඳහා ප්‍රතිචාර දැක්වීම, තොරතුරු දැන ගැනීමේ පනත මගින් වන ඉල්ලීම් සඳහා ඉක්මන් ප්‍රතිචාර දැක්වීම, මහජන පෙත්සම් ඉදිරිපත් වූ විට ඒ පිළිබඳව කටයුතු කිරීම.

**2.** ආයතනයේ කාර්යක්ෂමතාව ඉහල නංවා ගැනීම සඳහා ආයතනයේ සෑම අංශයකම උපරිම දායකත්වයක් ලැබෙන අයුරින් අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම, ලිපි ද්‍රව්‍ය භාවිතය අවම කරමින් ආයතනය තුළ හා ඉන් පිටත හැකි සෑම අවස්ථාවකදීම විද්‍යුත් තැපැල භාවිතා කර ලිපි,ලේඛන හුවමාරු කර ගැනීම, බාහිරින් ලැබෙන ලිපි සඳහා ඉක්මන් ප්‍රතිචාර දක්වමින් ඒවා අදාල අංශ වෙත යොමු කිරීම, සුදුසුකම් සම්පූර්ණ නිළධාරින් වෙත උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා පරිවාස කාල වාර්තාවන් නියමිත කාල වලදී සිදු කිරීම, මාණ්ඩලික නිළධාරි රැස්වීම් හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නිසි කාලයන් තුළ පැවැත්වීම හා කාර්යක්ෂමතා පුහුණු වැඩසටහන් ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම.

**3.** අදාල කාල සීමාවන් තුල ආයතනයේ සේවයේ නියුතු නිළධාරින්ගේ කාර්යමණ්ඩල වාර්තා හා ඊට අදාල තොරතුරු නිවැරදිව යාවත්කාලීන කරමින් ආයතන කටයුතු කාර්‍යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.

**4.** ආයතනයට ලැබෙන විගණන විමසුම් හා විගණකාධිපති වාර්තා සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමද, එම විමසුම් හා වාර්තාවලින් පෙන්වා දෙන අඩුපාඩුද නිරවුල් කරගනිමින් නිවැරදි ගිණුම් හා පාලන කටයුතු හරහා ආයතනයේ කාර්යක්ෂමතාවය උපරිම වන ලෙස කටයුතු කිරීම.

**5.** වවුචර්පත් හා අනෙකුත් ගෙවීම් නියමිත කලය තුළ සිදු කරමින් වැය ලෙජරය, මුදල් පොත, වැටුප් ලේඛනය, පොදු තැම්පත් ලේඛනය, සමාජික ණය ලේඛනය වැනි ලේඛන නිවැරදිව පවත්වාගෙන යාම තුලින් මාසික ගිණුම් සාරාංශ, බැංකු සැසඳුම් ප්‍රකාශනය ඇතුලු අනෙකුත් වාර්තාවන් නියමිත කාලයන් තුල ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, වාහන භාවිතය විධිමත්ව සිදු කිරීම මෙන්ම වාර්ෂික අයවැය සකස් කිරීම, මූල්‍ය ප්‍රකාශනය හා අත්තිකාරම් බී ගිණුම් ප්‍රකාශනය නියමිත කාලයන් තුළ ඉදිරිපත් කිරීම, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීම වැනි කාර්යයන් හරහා ආයතනයේ ගිණුම් කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම.

**6.** ආයතනයේ සෑම විෂයක් සඳහාම විෂය ගොණු ලේඛනයක් පවත්වාගෙන යාම තුළින් ලිපි ගොණු වල ආරක්ෂාව මෙන්ම රාජකාරි කටයුතු ඉටු කිරීමේදී පහසුවක් ඇති වන ආකාරයට ආයතනය තුළ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම, නිවැරදි කාර්යාල ක්‍රම අනුගමනය කිරීම, ස්ථාන මාරුවීම් වැනි අවස්ථාවන් වලදී ලිපිගොනු භාර ගැනීම හා භාර දීම විධිමත්ව සිදු කිරීම හා ලේඛනාගාරයක් පවත්වාගෙන යෑම වැනි කටයුතු ඉටු කිරීම.

**7.** විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 03 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් බහාලීමේ ව්‍යාපෘතිය මගින් උතුරු මැද පළාතේ ජලාශ 17 කට මත්සය පැටවුන් 766,958 ක් බහාලීම සිදු කර ඇති අතර ඒ සඳහා වැය වූ සමස්ථ වියදම රුපියල් 2,999,999 කි. මෙම ව්‍යාපෘතිය ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ මත්ස්‍ය අස්වැන්නද, ඉහල මට්ටමකට ගෙන එමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

**8.** විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 02 ක ප්‍රතිපාදන යොදා ගනිමින් ක්‍රියාත්මක වූ විසිතුරු මත්ස්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායකයන් 59 ක් පුහුණු වැඩසටහන් 04 ක් යටතේ පුහුණු කිරීම සිදු කර ඇති අතර, ව්‍යවසායකයන් 119 ක් ක්ෂේත්‍ර චාරිකා සඳහා සහභාගි කර එම අත්දැකීම ලබා දී ඇත. මීට අමතරව විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් හා අපනයනකරුවන් 400 ගේ සහභාගීත්වයෙන් සම්මේලනයක් පවත්වා ඔවුන්ට වෙළඳපොල අවස්ථා, දැනුම, තම අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාව උදා කර දී ඇත. මෙම ව්‍යාපෘතිය ආයතනයේ කාර්ය සාධන මට්ටම මෙන්ම පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහල මට්ටමකට ගෙන එමින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

**9.** ලෝක බැංකු හා ශ්‍රී ලංකා රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය 2022 වර්ෂයේ රුපියල් මිලියන 405.5 ක් උපයෝජනය කරමින් කෘෂි නිෂ්පාදන සහ අලෙවි ප්‍රවර්ධනය කිරීම, කෘෂිකර්මය සඳහා ජලය ලබා ගැනීම සහතික කිරීම හා ව්‍යාපෘති කළමනාකරණය ආදී ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරමින් කෘෂිකාර්මික කටයුතු වල ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා කටයුතු සලසා දී ඇත

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ළගාවීම සඳහා ආයතනය සැලසුම්කළ ඉලක්කය | එම ඉලක්කය ළගාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2022වර්ෂය තුළ ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2022 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75% - 100% |
| සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණතත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම ( 50,000 Mt) | ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරීම | ග්‍රාමීයමට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ 17 ක් සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරීම | | | ✓ |
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් 300 ක් පුහුණු කිරීම | විසිතුරුමත්ස්‍ය ව්‍යවසායකයින්ගේ දැණුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 578 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | | | ✓ |

### 5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.

තිරසර සංවර්ධන අරමුණු 02. යටතේ දැක්වෙන සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යටතේ සඳහන් 2030 වනවිට ළඟාකර ගත යුතු තත්වයන් සඳහා අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් තුළින් විශාල දායකත්වයක් සපයයි. නිදසුනක් ලෙස අංක 2.1 හි සඳහන් 2030 වනවිට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුතු, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම වෙනුවෙන් අවශ්‍ය වූ සියලු කාර්යයන් සාර්ථක අයුරින් අමාත්‍යාංශය මඟින් ක්‍රියාවට නංවා ඇත. මේ අතරින් මිරිදිය ධීවර නිෂ්පාදිතය සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සපයා ඇත


2022 වර්ෂයේදී සමස්ථ දිවයිනටම බලපාන ලද විවිධාකාර සංවර්ධන අභියෝග හමුවේ වුවද පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයේ සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් අත්කර ගැනීමට උතුරු මැද පළාත සමත්ව ඇත. 2022 ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහි මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිත ප්‍රමාණයන් වාර්තා වී ඇත්තේ පහත අයුරිනි

## වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය Mt – ( 2022)

| මාසය | අනුරාධපුර | පොළොන්නරුව | උතුරු මැද පළාත |
|---|---|---|---|
| ජනවාරි | 1,109.85 | 580.62 | 1,690.47 |
| පෙබරවාරි | 1,029.36 | 632.49 | 1,661.84 |
| මාර්තු | 1,209.76 | 674.06 | 1,883.83 |
| අප්‍රේල් | 1,229.07 | 862.77 | 2,091.84 |
| මැයි | 1,610.84 | 812.34 | 2,423.19 |
| ජුනි | 1,840.15 | 1,015.21 | 2,855.36 |
| ජුලි | 2,301.48 | 1,135.93 | 3,437.41 |
| අගෝස්තු | 2,440.08 | 1,598.41 | 4,038.49 |
| සැප්තැම්බර් | 2,722.99 | 1,654.12 | 4,377.11 |
| ඔක්තෝබර් | 2,181.63 | 1,572.64 | 3,754.27 |
| නොවැම්බර් | 2,160.24 | 1,625.27 | 3,785.51 |
| දෙසැම්බර් | 1,964.72 | 1,504.32 | 3,469.04 |
| **එකතුව** | **21,800.17** | **13,668.19** | **35,468.36** |

මූලාශ්‍රය - ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

## 2022 වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය (Mt) අනුරාධපුර හා පොළොන්නරුව



2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමස්ත මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය 13% ක් වර්ධනය වී ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී 57% ක සුවිශේෂී වර්ධයක් පෙන්නුම් කර ඇත. මේ අනුව පළාතේ සමස්ත මිරිදිය ධීවර නිෂ්පාදිතය 27% ක වර්ධනයක් අත්කරගෙන ඇත.


2018 වසරේ සිට 2022 වසර දක්වා පළාත තුළ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතයේ ප්‍රවණතා පහත අයුරින් දැක්විය හැකිය.

**<u>පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය 2018 – 2022 (Mt)</u>**

| වර්ෂය | අනුරාධපුර | පොළොන්නරුව | උතුරු මැද පළාත |
|---|---|---|---|
| 2018 | 19,940 | 11,600 | 24,540 |
| 2019 | 17,840 | 9,960 | 27,800 |
| 2020 | 21,855 | 9,505 | 31,360 |
| 2021 | 19,330 | 8,690 | 28,020 |
| 2022 | 21,800 | 13,668 | 35,468 |

**මූලාශ්‍රයජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය -**

**<u>පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය 2018 – 2022 (Mt)</u>**




2021 වසරේදී සමස්ත ජාතික මට්ටමේ මිරිදිය නිෂ්පාදිතය තුළ උතුරු මැද පළාතේ දායකත්වය 27% ක් වූ අතර, 2022 වසර වන විට මෙහි දායකත්වය 30% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2018 වසරේ සිට 2022 වසර දක්වා මෙම අගයන් පහත් සඳහන් පරිදි දැක්විය හැකිය.

ජාතික මට්ටමේ මිරිදිය නිෂ්පාදිතය හා පළාත් දායකත්වය 2022-2018

| වර්ෂය | ජාතික නිෂ්පාදිතය (Mt) | උතුරු මැද පළාත් නිෂ්පාදිතය (Mt) | ජාතික නිෂ්පාදිතයට පළාත් දායකත්වය |
|---|---|---|---|
| 2018 | 88,010 | 24,540 | 28% |
| 2019 | 90,580 | 27,800 | 31% |
| 2020 | 102,220 | 31,360 | 31% |
| 2021 | 104,450 | 28,020 | 27% |
| 2022 | 116,890 | 35,468 | 30% |

2022 වසරේදී අමාත්‍යාංශයීය කටයුතු විසිතුරු මත්ස්‍ය නිෂ්පාදිතය ඉහල නැංවීම උදෙසා විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා ප්‍රායෝගික හා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, මෙම කර්මාන්තය ද නව රැකියා අවස්ථාවන් උත්පාදනයටත් දේශිය හා විදේශීය විනිමය ඉපැයීම සඳහාත් දායකත්වය සපයා ඇත.

ධීවර නිෂ්පාදන සම්බන්ධයෙන් උතුරු මැද පළාත සතු සුවිශේෂී පාරිසරික විභවතාව එහි සාර්ථකත්වයට ශක්තියක්ව පවතී. 2022 වසරෙහි පැවති ආර්ථික හා සාමාජීය අර්බුධය මත ප්‍රතිපාදන ලැබීම සීමාවීම සෑම ක්ෂේත්‍රයකම පසුබෑමකට හේතු වුවත් වසරේ අවසන් කාලසීමාව තුළදී ධීවර අංශයට ලද විශේෂ ප්‍රතිපාදනය ඵලදායක අයුරින් ආයෝජනය කිරීමට හැකිවීම ආයතනය ලත් ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 04 | 03 | 01 |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 55 | 31 | 24 |
| ප්‍රාථමික | 13 | 7 | 06 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඉහත දක්වා ඇති දත්ත අනුව අමාත්‍යාංශය තුළ ජ්‍යෙෂ්ඨ, ද්විතික හා ප්‍රාථමික කාර්ය මණ්ඩල වල හිඟයක් පෙන්නුම් කරනු ඇත. මෙම හිඟය ආයතනයේ කාර්ය සාධනය උදෙසා පහත පරිදි බලපානු ඇත.

- ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
  අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) නිළධරයෙකුගේ පුරප්පාඩුවක් පවතී. මෙම පුරප්පාඩුව හේතුවෙන් ආයතනයේ පරිපාලන කටයුතු අපහසු වීම, සංවර්ධන කටයුතු මෙහෙයවීමේදී අවශ්‍ය දැනුම හා හැකියාව නොලැබීම නිසා ඉලක්ක හා අරමුණු ලගාකර ගැනීමේදී අපහසුතාවයන් වලට මුහුණ දීමට සිදු වීම හා දෙපාර්තමේන්තු දෙකෙහි සංවර්ධන කටයුතු පිළිබඳව අමාත්‍යාංශ මගින් සිදු කරන අධීක්ෂණ ක්‍රියාවලිය අපහසුවීම වැනි ගැටලු වලට මුහුණ දීමට සිදු වී ඇත.

- ද්විතීයික කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
  ද්විතික කාර්ය මණ්ඩලයට අයත් කළමනාකරණ සේවා නිළධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ආයතනික කටයුතු ඵලදායි අයුරින් සිදු කිරිම ගැටලුවක් වී ඇත තවද, සංවර්ධන නිළධාරී පුරප්පාඩු හේතුවෙන් සංවර්ධන කටයුතු මෙහෙයවීම, ක්ෂේත්‍ර අධීක්ෂණය, ප්‍රතිලාභීන් හා ආයතනය අතර සම්බන්ධීකරණ ක්‍රියාවලියට බාධා ඇති වීම වැනි ගැටලු වලට මුහුණ දීමට සිදු වී ඇත.

- ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ රියදුරු, කාර්යාල කාර්යය සහායක ප්‍රමාණවත් නොවීම.

  රියදුරු - ක්ෂේත්‍ර හා කාර්යාල කටයුතු සඳහා වාහන යෙදවීමේදී ප්‍රමාණවත් අයුරින් රියදුරන් නොමැති හෙයින් ඉලක්ක හා අරමුණු කෙරෙහි ළඟා වීමට බාධා ඇතිවීම.

  කාර්යාල කාර්යය සහායක - කාර්යාලය තුල එදිනෙදා සිදු කරන කටයුතු වලදී එම කටයුතු කාර්යක්ෂම හා ඵලදායී අයුරින් පවත්වානෙ යාම සඳහා කාර්යාල කාර්යය සහායින් ප්‍රමාණවත් නොවීම මත ගැටලු ඇතිවීම.

**6.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| නවක උපාධිධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩසටහන | 05 | දින 05 | | | දේශීය | ආයතන කාර්ය පටිපාටිය, රාජ්‍ය නිළධාරින්ට හිමි වරප්‍රසාද, කාර්යාල කළමනාකරණය, කාර්යාල ක්‍රම, විනය කාර්ය පටිපාටි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පරිගණක භාවිතය පිළිබඳ දැනුම. |
| නව සිගාස් මෘදුකාංගය මාර්ගගත ක්‍රමය යටතේ පවත්වාගෙන යාම සහ 2022 නව වර්ෂය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම | 02 | දින 01 | | | දේශීය | සිගාස් මෘදුකාංගය භාවිතය පිළිබඳ දැනුම ලබා ගැනීම හා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගැනීම. |
| ඵලදිායීතා සංවර්ධන පුහුණු වැඩසටහන් | 43 | දින 01 | | | දේශීය | ආයතනය තුළ ඵලදායීතාවය පවත්වාගෙන යනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම. |
| නවක උපාධිධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩසටහන | 03 | දින 05 | | | දේශීය | ආයතන කාර්ය පටිපාටිය, රාජ්‍ය නිළධාරින්ට හිමි වරප්‍රසාද, කාර්යාල කළමනාකරණය, කාර්යාල ක්‍රම, විනය කාර්ය පටිපාටි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පරිගණක භාවිතය පිළිබඳ දැනුම. |
| අවශ්‍යතා තක්සේරුව හා අයවැය ලේඛන සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින03 | | | දේශීය | අයවැය ලේඛන සකස් කිරීම හා අවශ්‍යතා තක්සේරු කිරීම හා ඒ සම්බන්ධ දැනුම. |
| වත්කම් කළමනාකරණය හා භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින 02 | | | දේශීය | භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය මගින් නිසි වේලාවන්ට භාණ්ඩ සමීක්ෂණ කටයුතු කිරීමට අවශ්‍ය දැනුම. |
| විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින 02 | | | දේශීය | මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු දායක මුදල් අය කිරීම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම පිළිබඳ දැනුම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ගිණි ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 01 | | | දේශීය | කාර්යාල පරිශ්‍රය තුළ හදිසි ගිනි ගැනීමකදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ප්‍රායෝගික දැනුම. |
| වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින 02 | | | දේශීය | ශ්‍රේණි උසස් කිරීම් වලදී වැටුප් පරිවර්තනය සිදු කරන ආකාරය පිළිබඳ හා වැටුප් පරිවර්තනය සම්බන්ධ චක්‍ර ලේඛ වලට අනුකූලව වැටුප් පරිවර්තනය පිළිබඳ දැනුම. |
| පාඩු හා අත්හැරදැමීමේ ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | 02 | දින 01 | | | දේශීය | පාඩු හා අත්හැර දැමීමේ ක්‍රියාවලියට අදාල ලේඛන පිළිබඳ හා භාවිතය පිළිබඳ දැනුම. |
| කළ.සේ. නිළධාරී සීමිත පදනම මත බඳවා ගත් නිළධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණු වැඩසටහන | 01 | දින 04 | | | දේශීය | ආයතන කාර්ය පටිපාටිය, රාජ්‍ය නිළධාරින්ට හිමි වරප්‍රසාද, කාර්යාල කළමනාකරණය, කාර්යාල ක්‍රම, විනය කාර්ය පටිපාටි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පරිගණක භාවිතය පිළිබඳ දැනුම. |
| පුහුණු කළමනාකරණ පද්ධතිය (TMS) පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 01 | | | දේශීය | ආයතනයේ කාර්යමණ්ඩල පුහුණු සඳහා සහභාගී වීමට මාර්ගගත කමවේදය ඔස්සේ නම් ඇතුලත් කිරීම හා පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් පළිබඳ TMS පද්ධතිය ඔස්සේ දැනුවත් වීම හා ඒවාට මාර්ගගතව අයදුම් කිරීම. |
| ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල සහයකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය | 02 | දින 01 | | | දේශීය | කාර්යාල ක්‍රම අනුගමනය කරමින් කාර්යාල කටයුතු ඉටු කරන්නේ කෙසේද යන්න හා ආකල්ප වර්ධනය ආශ්‍රිත දැනුම. |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 07 | | | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එක් එක් අධියරයන් හා ප්‍රසම්පාදන ක්‍රම පිළිබඳ දැනුම. |
| සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනිම් පරිපාටිය සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 01 | | | දේශීය | නව තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදයන් සකස් කිරීම හා ඒ පිළිබඳ දැනුම. |
| උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන | 03 | දින 01 | | | දේශීය | සේවා ව්‍යවස්ථාව සකස් කිරීම හා ඒ ආශ්‍රිත දැනුම. |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වූයේ කෙසේදෙ? යන්න කෙටියන් පැහැදිලිකරන්න.

- මෙම පුහුණු වැඩසටහන් මඟින් ආයතනයේ මෙහෙයුම් කටයුතු නිවැරදි අයුරින් පවත්වාගෙන යාමට මෙන්ම, ආයතනයේ අරමුණු හා ඉලක්ක වෙත ලගා වීමේදී පුහුණු වැඩසටහන් මගින් නිලධාරීන් ලබා ගන්නා දැනුම හැකියාවන් උපයෝජනය කරමින් එම අරමුණු හා ඉලක්ක සාර්ථකව සපුරාගත හැකි ය. එමෙන් ම කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම තුළින් අන්‍යෝන්‍ය අවබෝධය සහ සහෝදරත්වය ද වර්ධනය වේ.
- ඒ ඒ පුහුණුවීම් තුළින් අදාල නිලධාරීන්ගේ න්‍යාත්මක දැනුම වර්ධනය කිරීම තුලින් ආයතනය තුල අවශ්‍ය දැනුම වර්ධනය සඳහා පහසු වේ. එමඟින් ඵලදායි සේවයක් මහජනතාවට ලබා දීමට ඇති හැකියාව වර්ධනය වේ.
- නිලධරයන්ගේ දැනුම, ආකල්ප වර්ධනයෙන් ආයතනය තුළින් රටට අපේක්ෂා කරන දායකත්වය ඉහල මට්ටමක පවත්වා ගැනීමට මෙම පුහුණු වැඩසටහන් මහත් පිටුවහලකි.

- විවිධ ක්ෂේත්‍ර ආවරණය වන අයුරින් නිලධරයන් විවිධ පුහුණු වැඩසටහන් වලට ඉදිරිපත් කිරිම තුළින් ඔවුන්ට ආයතනයේ සියලු රාජකාරී කටයුතු පිලිබඳ දැනුම ලබා ගැනීමට හැකියාව පවතිනවා මෙන්ම ඔවුන්ට ඕනෑම ස්ථානයක ඕනෑම රාජකාරී කටයුත්තක් කිරිමට සුදුසු පුද්ගලයෙකු බවට පත් කිරිම මෙම පුහුණු වැඩසටහන් මගින් සිදු වන ප්‍රධානම කර්තව්‍යකි.

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදළ කර ගතයුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **<u>පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?</u>** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ. | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම. | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්. (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම්. | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම්. | - | - | - |
| 1.6 | වෙනත් ගිණුම්. | - | - | - |
| | | | | |
| **2** | **<u>පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රී 321)</u>** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණනවිමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.(ප.ස 37 පෝරමය) | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (ප.මු.රී 83)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදි බලතල පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 3.5 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 04/2022 චක්‍රලේඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාර විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරන ලිපියට අනුකූලව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම | අනුකූල වේ | - | - |
| | | | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **5** | **<u>විගණන විමසුම්</u>** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **6** | **<u>අභයන්තර විගණනය</u>** | | - | - |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | - | - |
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **7** | **<u>විගණන හා කළමණාකරණ කමිටු</u>** | | | |
| 7.1 | DMA චක්‍රෙල්ඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබිම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **8** | **<u>වත්කම් කළමණාකරනය</u>** | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමණාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේඅංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රෙල්ඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2022/08 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිතභාණ්ඩ අපහරණය කිරිම ප.මු.රී 490 අනුව සිදු කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.6 | කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකත් වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම | අනුකූල වේ | - | - |
| | | | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල නොවේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාල නොවේ | - | - |
| | | | | |
| 10 | බැංකු ගිණුම් කළමණාකරනය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | ප.මු.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට එලඹීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **12** | **<u>රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්</u>** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **13** | **<u>පොදු තැන්පත් ගිණුම</u>** | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | - | - |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **14** | **<u>අග්‍රිම ගිණුම</u>** | | | |
| 14.1 | ප.මු.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | ප.මු.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාරයය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | * වර්ෂ 2006 සිට පැවත එන නිරවුල් නොකළ අතුරු අග්‍රිම ශේෂයක් අමාත්‍යාංශයේ ගිණුම් වල පවතින අතර අනෙකුත් අතුරු අග්‍රිම සියල්ල නිවැරදිව නිරවුල් කර ඇත. | - |
| 14.3 | ප.මු.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **15** | **<u>ආදායම් ගිණුම</u>** | | | |
| 15.1 | ප.මු.රී.133 ට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අදාල නොවේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්තාවේම ඍජුවම ආදායමට බැර කර තිබීම. | අදාල නොවේ | - | - |
| 15.3 | ප.මු.රී. 116 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාල නොවේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **16** | <u>මානව සම්පත් කළමණාකරණය</u> | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **17** | <u>මහජනයා වෙත තොරතුරු ලබා දීම</u> | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | * වෙබ් අඩවිය මහජන භාවිතය සඳහා යෙදීමේ ඇති තාක්ෂණික ගැටලුවක් නිසා මෙම ක්‍රියාවලිය තාවකාලිකව නතර වී ඇත. | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **18** | <u>පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම</u> | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I)දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **19** | <u>මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.</u> | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම . | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **20** | **<u>විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.</u>** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |

ඩබ්.ජී.ඩබ්. වනසිංහ.
ලේකම් ,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා
සත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

සකස් කළේ,

අත්සන : …………………….

නම     : වයි.එම්.සී.පී. සිරිවර්ධන

තනතුර : සංවර්ධන නිළධාරි

අධීක්ෂණය,

අත්සන : …………………….

නම     : ඒ.යූ.ජී.ටී. නන්දසිරි

තනතුර : සහකාර ලේකම් (මුදල්)

අනුමත කරමි,

අත්සන : …………………….

නම     : ඩබ්.ජී.ඩබ්. වනසිංහ

තනතුර : ලේකම්, කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.